7 වන පිටුවෙන් (ප්‍රතිරූපය සහ )

යටතේ පන්නරය ලැබූ කිහිප දෙනෙක්ම තමන්ට අසන්නට ලැබුණු ඇණුම් බැණුම් පමණක් නොව පැසසුම් ද මා සමඟ කීවෝය.

මා මෙතෙක් වට වංගුවේ ගමන් කළේ මේ රටේදී ලද අත්දැකීම් කියන්නටය. එක් අතකින් එය මා ලද පරාජයක් ලෙසින් ද ගත හැකිය. වෙනසකට ඇත්තේ මා එසේ නොසැලකීම ය. තව අතකින් මා මවිතයට පත් කළ - අකමැත්තෙන් වුවත් මට අගය කරන්නට සිදු වූ වික්‍රමයක් ද එම සිද්ධීන් තුළින් ප්‍රදර්ශනය වන්නේය.

ගත වූ නොවැම්බර් මාසයේ උතුරු වික්ටෝරියානු ශ්‍රී ලාංකික ශුභ සාධක සංගමයේ අනුග්‍රහයෙන් පවත්වන ලද මගේ පොත් එළි දැක්වීමේදී මම මෙල්බර්න් ප්‍රකාශන දෙකක් ගැන තදින් කතා කළෙමි. මා යෙදූ බස දරුණු වැඩි යැයි ද කෙනෙකු සිතන්නට ඉඩ ඇත. මා ඒ ටික ලුණු ඇඹුල් සහිතව කීවේ බොහෝ විට ඔළුව අත ගා කියන දේ කණකට නොගන්නා නිසාය. "පහන" සහ "සන්නස" යන දෙකම සිය වගකීම පැහැර හැර ඇතැයි මම චෝදනා කළෙමි. එය චෝදනාවකට වඩා අභියෝගයක් ලෙසින් සලකනු ඇතැයි මම අවංකවම විශ්වාස කළෙමි.

මා අදත් කල්පනා කරන්නේ මේ රට පුරාම මඳ වශයෙන් වුව ද බෙදා හරිනු ලබන සිංහල ප්‍රකාශනයකින් ඉටු විය යුතු මූලික කාර්යය මේ රටේ වැඩෙන අපේ තරුණ පරපුර සිංහල කියවන සිංහලෙන් ඉඳහිට හෝ ලියන, සිංහලයන් බවට හැරවීමේ භාරදූර වගකීම ඉටු කිරීම ය. මා වැනි ඇටුවම්බැහැපු බැහැපු මහල්ලන්ට ඒ අතින් දිරි දීමක් අනවශ්‍යය. මා වැන්නන් හෙට අනිද්දා මේ මහ පොළොවෙන් අතුරුදන්ව යනු ඇත. මේ මහ පොළොව තමන්ගේ යයි සිතා ඒ විදියට ක්‍රියා කරන සිංහල දරුවන් අතරින් සුළු පිරිසක් හෝ තම මව්බස පරිහරණය කරන පිරිසක් කිරීමට නම්, ඔවුන්ගේ සිත් දිනා ගත හැකි විදියේ හරිහමන් යමක් සිංහලෙන් ලිවිය යුතුය. එසේ ලියන දේ ඔවුන් ගත කරන දිවියට අදාළ විය යුතුය. ඕස්ට්‍රේලියාවේ වාසය කරමින් මේ රටේ ජීවිතය අළලා ලියන පොතපත අතිශයින් වැදගත් වනුයේ ඒ නිසාය. ඒවා ගණනින් පමණක් නොව ගුණයෙන්ද වර්ධනය විය යුතුය. මෙහේ ඉඳන් ලියන බොහෝ දෙනා තවමත් මව්බිමේ ගුණ වැණුම අත්හැර නැත. එයින් මා කියන අරමුණ ඉටුවන්නේ නැත.

යට කී ප්‍රකාශන දෙකම මේ රටේ සිංහල ලේඛකයන් ලියන බස මෙන්ම ඔවුන් ලියන පොතපත ද උසස් තත්වයකට ඒමෙහි ලා මූලික වගකීම දැරිය යුතු බව මම අදත් කියමි. විශ්වාස කරමි. එය ඉටු කිරීම ගැන සිත යොමු නොකිරීම ගැනය එදා මා දොස් නැගුවේ.

පුවත්පත් කතුවරයකු පිළිබඳව මා සිතා සිටි සහ සිතා සිටින ආකාරයට අනුව නම් මා කී මිදිපාඩු ගැන පූර්ණ වගකීම ඒවායේ කතුවරුන්ට පැවරෙන්නේය.

මා මවිතයට පත් කරන ලද වික්‍රමය කරන ලද්දේ ඒ කතුවරුන්ගෙන් එක් කෙනෙකු විසින්ය. ඔහු තමාගේ ප්‍රකාශන වෙත එල්ල වුණු චෝදනාව දෑතින් ගෙන ලේඛක - පාඨකාදී සකලවිධ ප්‍රාණීන් වෙත බෙදා දී හිස් හැන්ද අතේ ඉතිරි කරගත් බවය, මට ඔහු ලියූ කතුවැකියෙන් පෙනී ගියේ.

එහෙත් මම මගේ තැන අත් නොහරිමි. මා කී දේ යළිත් සිතා බලන්නැයි ඔහුටත්,

අනෙක් කතුවරයාටත් ආයාචනා කරමි.



# පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

අළුත් අවුරුද්දේ උදේ පාන්දරම පින්සල ඇහැරුනේ හොඳ සින්දුවක සංගීතයෙනි.

"අද ඉපදෙන නැවුම් ලොවට
සිව්දෙවියනි වරම් දෙන්න...."

කුමාරදස සපුතන්ත්‍රි මහත්තයා ලියලා රෝහණ වීරසිංහ මහත්තයා සංගීතය හදලා සුනිල් එදිරිසිංහ මහත්තයා ගායනා කරපු සින්දුවක් ඒක.

"ශුභ අළුත් අවුරුද්දක්" පන්හිඳ සංගීත තැටි වාදන යන්ත්‍රය රෙදි කෑල්ලකින් පිහිනගමන් තවමත් ඇඳේ උන්න පින්ට ශුභ පතුවා.

"එසේ ම - එසේ ම වේවා!" ඒ පින් ,"තමුනනැහේ ඉතින් උපන් දිනේට ශුභ පැතුවත්, එසේ ම - එසේ ම වේවා, කියන එකනෙ කරන්නේ."

"ඔන්න ඉතින පටන් ගත්තා නෝක්කාඩුව. ඒක නෙවි; දැක්කද අර ප්‍රසන්නයි නාලකයි එවල තිබුණ 'පුංචි අමරදේවගෙ' වීඩියෝ ක්ලිප් එක. ප්‍රසන්න කුලරත්න උන්නැහේයි නාලක වීරකෝන් උන්නැහේයි විදුලි තැපෑලෙන් එවලා තිබුණේ ලංකාවේ 'දෙරණ' රූපවාහිනි යෙන් විකාශයකරපු 'ලිට්ල් ස්ටාර්' වැඩසටහනේ කොටසක්. හිමාෂ මනුප්‍රිය කියන වයස අවුරුදු පහක පුංචි කොලු පැටියාවයි මේ විදිහට 'ලිට්ල් අමරදේව' කියලා නම් කරලා තිබුණේ."

"තුම්මන්සලේත් දලා තිබුණා". පන් පරණ අවුරුද්දේ ලියකියවිලි මේසයෙන් අයින් කරන්න පටන් ගත්තා. කලින් ද කඩෙන් ගෙනාව ලිපි ලියන කොල එකතුව සුදේ සුදුවට මේසෙ මැද්දෙ දිළිහුණා. අළුත් කොලවල රූල් තවම හිස්, සින්දුව ඉවරවෙනකොට පන්ගේ හිත පිරිලා ඉතිරිලා ගියා වගේ වුණා. මෑතකදි මෙල්බර්න් නුවර දි ඉපදුණ අපේ සිඟිත්තියකගේ මූණ මතක්වෙලා පන් ගේ ඇහැට කඳුලක් ඉණුවා. රූල් පිරී යන්න පටන්ගත්තා.

නොරටක වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇත්තවුනට දාව උපදින දරු දැරියෝ උපතින් ම ඒ රටවල පුරවැසිකම් ලබත්, ඔවුන් ඒ රටවලට අයත් සම්පත් සේය, ඒ ඒ රටවල් සලකන්නේ. ලොව ඇති උතුම්ම සම්පත වන මිනිස් සම්පත උපන් ද සිට නීරෝගීව රැක ගැනීමට ඔවුන් දරනා තැත ප්‍රශස්ථයි.

මෑතකදි පන්ට කතා කරපු අතිජාත මිත්‍රයෙක්ගෙ කතාවක්

# "අද ඉපදෙන නැවුම් ලොවට සිව් දෙවියනි වරම් දෙන්න!"

මතකවුණා.

"මචං අපේ පන්ති මිත්‍රයෙක් හතරවෙනි කාර් එකත් ගත්තේ"

"ඉතින් මරුනේ........ උඹත්ගනින්!."

"අනේ මචං මම වාහන ගන්න නං හිතුවේ නෑ.. හැබැයි ඉතින් දරු පැටියො නං හතර දෙනෙක් ඉන්නවා."

"ඔන්න ඔතන තමයි මචං අපේ උන් පටලවාගත්ත තැන. වාහන එකතු කරන එකද දරුවො මේ ලෝකෙට එකතුකරන එකද වටින්නෙ?"

"හා - හා උඹ ඕක ඇඟට ගන්නෙ නැතුව හිටපන් ! ඔය ඔක්කොම ජාති එකතු කරන උනුත් ඉන්නවා!" අතිජාත මිත්‍රයා දුරකථනයේ කෙළවරින් පන්ට හිනා වුණා.

"හැබැයි ඉතින් දරු පැටව් එක්ක එකට යන්න මම එක සෙවන් සීටර් වාහනයක් නම් තියාගෙන ඉන්නවා". මිත්‍රයා ව්‍යංගාර්ථයෙන් කියන්නේ මොනවද කියලා පන්, පින්ට නම් පැහැදිළි කරලා දුන්නා.

කුමන කාලයක, කුමන දේශයක, කුමන තරාතිරමක, උපන ද දරුවා සම්පතක්මය. ඔවුන් මෙලොවට උපතින්ම ගෙන එන හපන්කම් ශක්තීන් මොනයම් අන්දමකින් හෝ මිළ කල හැකිවේද? නැත්තේමය, ඊට කදිම නිදසුනකි "පුංචි අමරදේව" ඔහු විනිශ්චය මණ්ඩලය ඇතුළු රසික සමූහයා පිනැවීමට ගයන්නේ සුළු පටු ගීතයක් නොවේ ඒ. ජේ. කරීම් නැමැති ප්‍රවීණයා කාලයකට පෙර ගයා රසිකයන් අතරට ගිය, ගැයීමට අපහසු ගීතයකි. එද බර වචනවලින් ගහණ පද මාලාවකි. "පුංචි අමරදේව" මුළු ගීයම ගයන්නේ පද මාලාව ලියාගත් කොල අතේ තියාගෙන නොවේ, මතකයෙනි. ගීයේ මුල සිට අග දක්වාම ඔහු පානා ප්‍රසාංගිකත්වය ඒ තරම් කුඩා වියේ දරුවකුගෙන් කිසිසේත්ම බලාපොරොත්තු විය හැකි හපන්කමක් නොවේ. ගීතයේ වූ සුගායනීය තැන් මනා සේ හඳුනාගෙන ප්‍රසාංගිකත්වය ද සමගින් ඔහු ගායනා කරනවිට දැනෙන්නේ එය මුල් ගායන ශිල්පියාටත් වඩා මැනෙවින් ගයන්නේ දැයි චකිතයකි. ඩබ්. ඩී. ඇල්ප්‍රඩ් නමින් උපන් අමරදේවයන්, "අමරදේව" යන නම ලැබුවේ ජනතාව වෙතිනි. ඒ එතුමන් පෑ හපන්කම් නිසාවෙනි. ජනතාව දුන් ජනතාවගේ "අමරදේව" නාමයම මේ කුඩා හිමාෂ මනුප්‍රිය දරුවාටත් ජනතාව විසින්ම පටබැඳීම පිළිබඳව අමරදේවයන් පවා සතුටුවනු නොඅනුමානය. මොන රටක අද අප විසුව ද එය අපගේ ද අමන්දානන්දයට හේතුවක්මැයි.

"පුංචි අමරදේවයන්" ගෙන් අපව වටහාගත යුතු තවත් කරුණු කිහිපයකි. උපතින් යමෙකු ගෙන එන නිසඟ කුසලතාවයන්ට සමකළ හැකි කිසිවක් නොවේ. එයයි සොබාදහමේ ආශචර්ය ය. විද්‍යාව කෘතිමව ස්වභාවය හා ගැටෙමින් එය තමා නතු කරගැනීමට අර ඇන්ද ද ඒ සියල්ල වෙනස් කිරීමට සුළු මොහොතකි ගතවන්නේ. ස්වභාවයට සමාන්තරව එහි යහ ගුණ වැඩීමට උපකාර කිරීම වඩාත් වැදගත් වනුඇත. නිසඟ කුසලතාවයන් පානා දරුවන් හඳුනාගෙන එම කුසලතා ඔප් නංවා ගැනීමට අත දිම කෘතිමව යන්ත්‍ර ලෙසින් කුසලතා රෝපණය




කරගැනීමට යත්න දරනවාට වඩා ඵලදායී වනු ඇත. අධ්‍යාපනයෙන් කුසලතා වඩවා ඔප්නංවාගත හැකියි. එහෙත් විය පැහැදම් කිරීමට මුදල් ඇති නිසාවෙන් ආයාසයෙන් කුසලතා මිළයට ගැනීමට උත්සාහදැරීම විහිළුවක් නොවේද? මෙය කලාවට පමණක් සීමාවූවක් නොවේ.

අනෙක් අතින් ආයාසයෙන් කීර්තිය වඩවා ගන්නට උත්සහ දරන වුන්ගෙන් උපන් හපන්කම් ඇතිවුනට කෙරෙන අසාධාරණකම් ද අපගේ අවධානයට ලක්විය යුතුයි.ඇති හැකිවුනගේ බැල මෙහෙවර කරනු වෙනුවට නියම සම්පත් හඳුනාගන්නා මාධ්‍ය පිළිබඳව අප කතා කළයුතුවේ. "පුංචි අමරදේව" වේදිකාප්‍රාප්තකළ "දෙරණ" රූපවාහිනී මාධ්‍යයට අපගේ ප්‍රණාමය හිමි විය යුත්තේ ඒ නිසාවෙනි.

අළුතින් උපදින පරම්පරාවට "වරම්" දෙන සිව් දෙවියන් වැනිය එවන් මාධ්‍ය හසුරවන්නන්. මාධ්‍යවලට පළමුව අප සිතා බැලිය යුතු දෙව් පිරිසක් වේ "පුංචි අමරදේව" ගේ මව යැයි සිතිය හැකි කාන්තාවක අපි ඒ දර්ශන පෙළෙහි දුටිමු. ඇය සාමාන්‍ය කානතාවකි. නමුත් ඇය සිය දරුවාගේ හපන්කම් හඳුනාගෙන නිසි තැනට ඔහු යොමුකරවා ඇත්තීය. එවන් දෙමව්පියන් පිළිබඳ අතීත පූර්වාදර්ශද බොහෝ ය. එවන් දෙමව්පියන් රටකට, දැයකට මතු නොව ලොවටම වාසනාවකි. ලොවට "සනත් ජයසූරිය" ලා බිහිවූයේ ඒ මහිමයෙනි. දෙවැනි පිරිසනම් ගුරුවර ගුරුවරියන් ය. කුහක ඊර්ෂ්‍යා සිතින් මිදී සිය සිසු දරු දැරියන්ගේ අභිවෘද්ධිය ම පතනා ගුරු මෑණිවරු හා පියවරු පිළිබඳ මින් පෙරදී ද සටහන් තැබූයමු. නැති බැරි දක්ෂයින්ට අත හිත දෙන පිරිසයි අනික් පිරිස. මාධ්‍යය මෙහිලා වැදගත් ස්ථානයක් ගනියි.

නොරටක ලැගුම් ගෙන සිටින්නා වූ ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති අප අතරින්ද පිපෙන කුසුම් බොහෝ යි. වික්ටෝරියාවේ ශ්‍රී ලංකා ගායන ශිල්පී සංගමයෙන් පැවැත්වූ "ගී සර ගී රස" ප්‍රසංගවේදිකාවෙන් අප හඳුනාගත් මාධව මාපා කුඩා දරුවා ද එවැන්නෙකි. බටහිර තාල වාද්‍ය කට්ටලය ඔහු අතින් වැයුනේ මුළු සිරුරටම රිද්මය ආරෝපණය කරගත් පැංචෙකු සේය. ඔවුන් සමාජයට හඳුන්වාදීම මාධ්‍යවල පරම යුතුකම වන්නේය. එය ඔවුනට අප ලබා දෙන වටිනාම වරමයි. සපුතන්ත්‍රි රචකයාණන් සිය පදවැලෙහි ලියුවේ "අද ඉපැදුණා" යනුවෙනි. මෙහිදී අප එය "අද ඉපැදෙන" යනුවෙන් නම් කරන්නෙමු. මෙරට තනිවූ අපගේ තෙවන පරපුරද බිහිවෙමින් පවතියි. අද ඉපැදෙන ඒ පරපුරට කුහක බවින් හා තරඟකාරීත්වයෙන් මිඳුන දෙව්වරුන්ගේ වරම් අවශ්‍යමය.

සැමටම සුභ නව වසරක් ! පින් ලියන මේසයෙන් නැඟිට්ටේය.